**ශීර්ෂය 328 - මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව**

**----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

-------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ඔක්තෝම්බර් 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශවල වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ මූලධන වියදම්වල මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.37,779,000 ක් විය යුතු වුවත් එහි එකතුව රු.36,397,000 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූලධන වියදම් එකතුව රු.1,382,000 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | අතපසුවීමකින් එය සටහන් කර ඇති අතර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

### 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අත්තිකාරම් බී ගිණුමේ සේවයේ නියුතු නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂ ලැයිස්තුවේ දක්වා ඇති ශේෂයන්, සාමාජික ණය ලේඛනයේ දැක්වෙන ශේෂයන් අතර රු.18,462 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම ප්‍රමාද දෝෂයන් දැනට නිවැරදි කර ඇති අතර ඉදිරියට නිවැරදිව සටහන් කිරීමට උපදෙස් දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂ ලෙස දක්වා ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.133,870 ශේෂය සාමාජික ණය ලේඛනයේ දක්වා නොතිබුණි. | අතපසුවීමකින් ණය ලේජරයේ සටහන් කර නොතිබූ අතර එය සටහන් කර නිවැරදි කරන ලදී. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සාමාජික ණය ලේඛනයේ සඳහන් ණය ශේෂයට අනුව එක් නිලධාරියෙකුගේ ණය ශේෂය රු.166,000 ක් වැඩියෙන්ද තවත් නිලධාරියෙකුගේ ණය ශේෂය රු.3,750 ක් අඩුවෙන්ද අත්තිකාරම් බී ගිණුමේ දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූලධන වැය විෂයන් 05 ක් හා පුනරාවර්තන වැය විෂයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.1,333,944 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 74 දක්වා පරාසයක පැවතුණි. | රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂා කළ පරිදි වියදම් සිදු නොවීය. | නිවැරදිව ප්‍රරෝකථනය කළ වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කළ යුතු වීම. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ඡේදයට අනුව 2020 වර්ෂයේ වාර්තා නොකරන ලද කිසිඳු බැරකමක් 2021 වර්ෂයේ නිරවුල් නොකළ යුතු වුවද එයට අනුකූල නොවන පරිදි 2020 වර්ෂයේ භාණ්ඩ හා සේවා ලැබීම්වලට අදාළව එකතුව රු.2,726,637 ක් සඳහා 2021 වර්ෂයේදී ගෙවීම් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම වියදම් බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ පසු ඉදිරිපත් වූ වවුචර්පත් වල අගයන් ඇතුලත් කර නොමැති අතර සමහර අගයන් ප්‍රමාද දෝෂ නිසා ඇතුලත් වී නොමැති බව පිළිගනිමි. | බැරකම් පිළිබඳ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගිණුම්ගත කළ යුතු වීම. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව රාජ්‍ය අමාත්‍යාංශයේ පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වන අතර මේ සම්බන්ධයෙන් සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන අතර ඒ පිළිබඳව කාර්තුමය වශයෙන් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා දෙපාර්තමේන්තුවේ අභයන්තර විගණන අංශය වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලබයි.ඉදිරියේදී විගණකාධිපති වෙත එහි පිටපතක් ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තිකාරම් "බී" පාලන ගිණුම අනුව සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.15,835 ශේෂය මේ වන තෙක් මුළුමනින්ම අයකරගෙන නොමැති අතර ඒ පිළිබඳ කිසිදු සටහනක් ණය ගැති කාල විශ්ලේෂණයේ දක්වා නොමැත. දැනට සේවයේ නියුක්ත නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු මාස 02 කට අදාළ රු.16,958 ක් වූ ණය වාරික අයකර ගෙන නොතිබුණු බවද තවදුරටත් නිරීක්ෂණය විය. | සේවය හැරගිය නිලධාරියාගෙන් අයවිය යුතු ශේෂය ඔහුගේ ඇපකරුවන්ගෙන් දැනටමත් වාරික වශයෙන් අයකර ගන්නා අතර අනෙකුත් ණය වාරික දැනටමත් අයකරගෙන ඇත. | විධිමත් පරිදි හිඟණය වාරික අයකර ගත යුතු වීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂය තුළදී තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති රු.7,500,000 ක් වටිනා මෝටර් රථය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අනෙකුත් ආයතන වලින් මාරු කිරීම්වල දක්වා නොතිබුණි. තවද මෙම මෝටර් රථයේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | මෙම රථය තාවකාලිකව පවරා ඇති බැවින් එය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සඳහන් කර නොමැත. එම රථය පවරා දෙන ලෙස ඉල්ලීම් කළත් එය සිදු කළ නොහැකි බව දැනුම් දෙන ලදී. | වත්කම්වල හිමිකාරිත්වය නිරවුල් කර ගත යුතු වීම සහ වත්කම් නියමිත පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමේ ඉලක්කයන් සඳහා වන ජයග්‍රහන දර්ශකවල ප්‍රගතිය සියයට 19 සිට සියයට 66 අතර මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා රට වසා තැබීම සහ වරින්වර සීමා පැනවීම නිසාද, අඛන්ඩව පාසල් වසා තැබීම, මැතිවරණ කාලසීමාවේදී රැකියා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමට අවසර නොලැබීම යන හේතු මත ඉහත ඉලක්ක ඉටුකර ගැනීමේ පසු බෑස්මක් ඇති විය. නමුත් මෙම වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු නිසා පාසල් සිසුන් සම්බන්ධ වැඩසටහන් **Zoom** තාක්ෂණය හරහා **Virtual Programme** ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමට අවශ්‍ය ප්‍රගතිය ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය නියමිත ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කල යුතු වීම. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 07 ක් තෘතිය මට්ටමේ පුරප්පාඩු 04 ක්, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 80 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 ක් ඇතුළු මුළු පුරප්පාඩු 95 ක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ හා තෘතික මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන ලේකම් සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. වෘත්තිය මාර්ගෝපදේශ තනතුරු සඳහා 56 ක් සඳහා පුරප්පාඩු දක්වා තිබුණද අනුමැතිය සඳහා යවා ඇති ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වන උසස්වීම් පටිපාටියේ දැනට සිටින නිලධාරීන්ට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව අනුමත කර ඇති බැවින් නැවත බඳවා නොගැනේ. සංවර්ධන නිලධාරි පුරප්පාඩු පිළිබඳ ඒකාබද්ධ සේවා ජනරාල් දැනුවත් කර ඇති අතර දැනට 18 දෙනෙකු බඳවා ගෙන තිබේ. | අවශ්‍යතා පරිදි දෙපාර්තමේන්තුවේ සේවක ඌනතාවයන් සම්පූර්ණ කිරීම. |